# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1889/30 - 2014 නොවැම්බර් මස 19 වැනි බදාදා - 2014.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල<br>පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත<br>(262 වන අධිකාරය වූ)<br>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ<br>අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ<br>සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අහමඩ් ලෙබ්බෙ සුබෙයිඩීන් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන අබ්දුල් කරීම් ඉබ්‍රාලෙබ්බෙ මොහමඩ් නසීර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අබ්දුල් කරීම් ඉබ්‍රාලෙබ්බෙ මොහමඩ් නසීර් මහතා අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,<br>තේරීම් භාර නිලධාරී,<br>අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 18 වන දින,<br>දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>අම්පාර.

12 - 133


1A - G 20634 — 40 (2014/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

අවසරය ලබා නොගෙන මාස තුනක කාල සීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගි නොවීම හේතු කොට ගෙන කටුවන ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ජාසිංගේ රොෂාන් කරුණාරත්න නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඕමල්පගේ චන්දන තිලක් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කටුවන ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී උඩහ දාසිලිගේ දීපාල් දර්ශන චන්ද්‍රරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඕමල්පගේ චන්දන තිලක් මහතා කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දීපාල් චන්ද්‍රරත්න,
තේරීම් භාර නිලධාරී,
කටුවන ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 19 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

12 - 134

---

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව**

නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන අමරදාෂ ආනන්ද මහතා ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අතහැර ඇති බව නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම් භාර නිලධාරී,
නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 18 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

12 - 135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.